1st Place Winner
National Productivity
Award 2020

ප්‍රධාන ලේකම් කාර්යාලය - දකුණු පළාත
பிரதான செயலாளர் அலுவலகம் - தென் மாகாணம்
CHIEF SECRETARIAT - SOUTHERN PROVINCE

මගේ අංකය எமது இல. My Ref.	CSS/03/13/CIR.COM.(3)	ඔබේ අංකය உமது இல. Your Ref.		දිනය திகதி Date	2026.10. 26

ආණ්ඩුකාර ලේකම්, ආණ්ඩුකාර ලේකම් කාර්යාලය,
සභා ලේකම්, සභා ලේකම් කාර්යාලය,
ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
සියලුම අමාත්‍යාංශ ලේකම්වරු / සියලුම නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරු,
සියලුම දෙපාර්තමේන්තු ප්‍රධානීන් / ව්‍යවස්ථාපිත ආයතන ප්‍රධානීන්,
දකුණු පළාත.

පළාත් සභා මූල්‍ය රීති 562 ප්‍රකාර ව දකුණු පළාත් සභාව සඳහා වක්‍රලේඛ අදාළ කර ගැනීම

උක්ත කරුණ සම්බන්ධයෙන් මා ඇමතූ දකුණු පළාත් ආණ්ඩුකාර ලේකම්ගේ අංක GS/SP/01/01/01/01(i) හා 2026.10.22 දිනැති ලිපිය හා බැඳේ.

02. එමඟින්, පහත සටහනේ දක්වා ඇති වක්‍රලේඛය, වක්‍රලේඛය නිකුත් කළ දින සිට දකුණු පළාත් සභාවට අදාළ කර ගැනීම සඳහා 2026.10.22 දාතමින් ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලැබී ඇති බව මා වෙත දැනුම් දී ඇත.

අනු අංකය	වක්‍රලේඛය නිකුත් කළ ආයතනය	වක්‍රලේඛ අංකය	නිකුත් කළ දිනය	වක්‍රලේඛයේ ශීර්ෂය
01.	රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශය	රාජ්‍ය පරිපාලන වක්‍රලේඛ 25/2014 (I)	2014.12.29	තාවකාලික, අනියම් (දෛනික), ආදේශක, කොන්ත්‍රාත් හෝ සහන පදනම මත බඳවා ගෙන ඇති සේවකයින් සඳහා 2015 අයවැය යෝජනා අනුව ස්ථිර පත්වීම් ප්‍රදානය කිරීම.

03. ඒ අනුව, උක්ත කරුණ සම්බන්ධයෙන් ඔබ යටතේ පවතින අදාළ ආයතන දැනුවත් කරන මෙන් කාරුණික ව දන්වා සිටිමි.

රනිල් වික්‍රමසේකර
නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන)
ප්‍රධාන ලේකම් වෙනුවට
දකුණු පළාත

ප්‍රධාන ලේකම්
பிரதான செயலாளர்
Chief Secretary
091 2222603

කාර්යාලය
அலுவலகம்
Office
091 4119011
091 2234052

091 2246299
chiefsec1@sltnet.lk
www.cs.sp.gov.lk

එස්.එච්. දහනායක මාවත, ගාල්ල.
S.H. Dahanayaka Mawatha, Galle.
எஸ்.எச்.தஹநாயக மாவத்தை, காலி.

මගේ අංකය / எனது இல. / My Number	GS/SP/01/01/01/01(i)	ඔබේ අංකය / உமது இல. / Your Number	CSS/03/13/CIR.COM.(3)	දිනය / திகதி / Date	2026.10. 22

ප්‍රධාන ලේකම්,

දකුණු පළාත.

ලැබිණා
23 OCT 2026
ප්‍රධාන ලේකම්
දකුණු පළාත
GS/SP

<u>පළාත් සභා මූල්‍ය රීති 562 ප්‍රකාරව</u>

<u>දකුණු පළාත් සභාව සඳහා චක්‍රලේඛ අදාළ කර ගැනීම</u>

උක්ත කරුණ සම්බන්ධයෙන් ඔබ විසින් මා වෙත යොමු කරන ලද ඔබේ සමාංක හා 2026.10.19 දිනැති ලිපි හා බැඳේ.

02. ඒ අනුව පහත දැක්වෙන චක්‍රලේඛ, අනු අංක 01 සිට අනු අංක 08 දක්වා එය නිකුත් කළ දින සිට බලාත්මක වන පරිදි, දකුණු පළාතට අදාළ කර ගැනීම සඳහාත්, අනු අංක 09 දරණ චක්‍රලේඛය දකුණු පළාතට අදාළ කර ගැනීම සඳහාත් ගරු ආණ්ඩුකාරතුමා විසින් 2026.10.21 වැනි දින අනුමැතිය ලබා දී ඇති බව කාරුණිකව දන්වා සිටිමි.

අනු අංකය	චක්‍රලේඛ අංකය හා දිනය	චක්‍රලේඛයෙහි සඳහන් විස්තරය
01	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ: 04/2017 – 2017.02.28	ප්‍රායෝගික පුහුණුව සඳහා අභ්‍යාසලාභීන් රාජ්‍ය ආයතනවලට අනුයුක්ත කිරීම.
02	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ: 04/2017 (I) – 2017.08.10	
03	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ: 04/2017 (III) – 2017.09.07	
04	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ: 25/2014 - 2014.11.12	තාවකාලික, අනියම් (දෛනික), ආදේශක, කොන්ත්‍රාත් හෝ සහන පදනම මත බඳවා ගෙන ඇති සේවකයන් සඳහා 2015 අයවැය යෝජනා අනුව ස්ථිර පත්වීම් ප්‍රදානය කිරීම.
05	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ: 25/2014 (I)– 2014.12.29	
06	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ: 25/2014 (II) – 2016.04.04	
07	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ: 29/2019 – 2019.09.18	තාවකාලික, අනියම් (දෛනික), ආදේශක, කොන්ත්‍රාත් හෝ සහන පදනම මත බඳවා ගෙන ඇති සේවකයන් සඳහා ස්ථිර පත්වීම් ප්‍රදානය කිරීම.

ලිපිනය: පහළ ඩික්සන් පාර, ගාල්ල.
දුරකතන : 091-2234480
ෆැක්ස්: 091-2229811
ඊ-මේල්: governsecspc@sltnet.lk
වෙබ් අඩවිය: governor.sp.gov.lk

முகவரி: கீழ் டிக்சன் வீதி, காலி.
தொலைபேசி: 091-2234480
தொலைநகல்: 091-2229811
மின்-அஞ்சல்: governsecspc@sltnet.lk
இணையதளம்: governor.sp.gov.lk

Address : Lower Dikson Road, Galle.
Telephone : 091-2234480
Fax: 091-2229811
e-mail: governsecspc@sltnet.lk
Website: governor.sp.gov.lk

අනු අංකය	චක්‍රලේඛ අංකය හා දිනය	චක්‍රලේඛයෙහි සඳහන් විස්තරය
08	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ: 01/2024 – 2024.04.16	වයස අවුරුදු 45න් පසුව පත්වීම් ස්ථිර කරන ලද සේවකයන් වෙත විශ්‍රාම වැටුප් ලබාදීම රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 25/2014,25/2014(I)සහ 29/2019 සම්බන්ධයෙනි.
09	සෞඛ්‍ය අමාත්‍යාංශයේ චක්‍රලේඛ: 01 - 44/2026 - 2026.10.02	Certification of Thalassaemia Patients for Monthly Financial Assistance

03. ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලද ඉහත චක්‍රලේඛයන්හි පිටපත් 01 බැගින් මේ සමග අමුණා ඔබ වෙත කාරුණිකව ඉදිරිපත් කරමි.

කේ.පී.එස්.දමයන්ති
පරිපාලන නිලධාරි
ආණ්ඩුකාර ලේකම් කාර්යාලය
දකුණු පළාත

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ : 25/2014(I)

මගේ අංකය : EST-4/PEMNT/03/0225
රාජ්‍ය පරිපාලන සහ
ස්වදේශ කටයුතු අමාත්‍යාංශය
නිදහස් චතුරස්‍රය
කොළඹ 07.

2014.12.29

අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්
රාජ්‍ය සංස්ථා සහ ව්‍යවස්ථාපිත මණ්ඩල ප්‍රධානීන්

තාවකාලික, අනියම් (දෛනික), ආදේශක, කොන්ත්‍රාත් හෝ සහන පදනම මත බඳවා ගෙන ඇති සේවකයින් සඳහා 2015 අයවැය යෝජනා අනුව ස්ථිර පත්වීම් ප්‍රදානය කිරීම

2014.11.12 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 25/2014 කෙරෙහි අවධානය යොමු කරවමි.

02. ඉහත චක්‍රලේඛයේ 03 ඡේදයේ සඳහන් අධ්‍යාපන සුදුසුකම් සම්පූර්ණ කර නොමැති ප්‍රාථමික සේවා ගණයට අයත් සේවකයින් ස්ථිර කිරීමේ දී පහත පරිදි කටයුතු කිරීමට රජය තීරණය කර ඇත.

(I). කාර්යාල සේවක සේවයේ ව්‍යවස්ථා සංග්‍රහයේ හෝ අනුමත බඳවා ගැනීමේ පරිපාටිවල අධ්‍යාපන සුදුසුකම් සපුරා නැති එහෙත් 2014.05.01 දිනට වසර 03ක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති තාවකාලික, අනියම් (දෛනික), ආදේශක, කොන්ත්‍රාත් හෝ සහන පදනම මත බඳවාගෙන ඇති ප්‍රාථමික සේවා ගණයන්ට අයත් සේවකයින් පහත සඳහන් පරිදි ස්ථිර තනතුරුවලට බඳවා ගැනීම.

අ) අධ්‍යාපන සුදුසුකම් සපුරා ගැනීම සඳහා සති අන්ත දින 10ක පුහුණු පාඨමාලාවක් සංවිධානය කිරීම.

ආ) මෙම පුහුණු පාඨමාලාව ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ අධීක්ෂණය හා මහ පෙන්වීම මත දිස්ත්‍රික් ලේකම් කාර්යාල මට්ටමින් පැවැත්වීම.

ඇ) පුහුණුව අවසානයේ සුදුසුකම් ලබන සේවකයින් සඳහා ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය මඟින් විධිමත් සහතිකයක් නිකුත් කිරීම.

ඈ) එකී සහතිකය ලබාගත් සේවකයින් 8 ශ්‍රේණිය සමත් වූවා සේ සැලකීම.

03. ඉහත 02 (I) උප ඡේදයෙහි සඳහන් සුදුසුකම් සපුරාගැනීම සඳහා අවශ්‍ය වන සුදුසු පාඨමාලා පැවැත්වීම සම්බන්ධයෙන් දිස්ත්‍රික් ලේකම්වරුන් සමඟ සාකච්ඡා කර, විධිමත් පරිදි එකී පාඨමාලා පැවැත්වීමට අදාළ පත් කිරීම් බලධරයන් පියවර ගත යුතුය.

04. දේශීය අරමුදලින් ක්‍රියාත්මක වන ව්‍යාපෘතිවල තාවකාලික, අනියම් (දෛනික), ආදේශක, කොන්ත්‍රාත් හෝ සහන පදනම මත බඳවාගෙන, එම කටයුතුවල සේවයේ යොදවා ඇති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 25/2014 හි ඇතුළත් වැටුප් කේතයන්ට අදාළ තනතුරුවල සේවයේ යෙදෙන්නන් එම තනතුරුවලම ස්ථිර පත්වීම් ප්‍රදානය කිරීමට අදාළ පත් කිරීම් බලධරයන් විසින් ක්‍රියා කළ යුතුය.

05. විදේශ අරමුදලින් ක්‍රියාත්මක වන සංවර්ධන ව්‍යාපෘති සඳහා හෝ එවැනි ව්‍යාපෘතිවල දේශීය සේවා සපයන ආයතන වෙතින් බඳවාගෙන සේවයේ යොදවා ඇති සේවකයින්ද ඉහත 04 ඡේදයේ පරිදි ස්ථිර කිරීමට කටයුතු කළ යුතුය.

06. මෙම චක්‍රලේඛය මහා භාණ්ඩාගාරයේ එකඟතාව ඇතිව නිකුත් කරන ලදි.

මෙම රාජ්‍ය පරිපාලන
~~අමාත්‍ය~~ 25../2014(II) චක්‍රලේඛය.
~~ලේකම්~~ 2024/12/29 දින සිට
පළාත්සභාවට අදාල කර ගැනීම
සඳහා ගරු අමාත්‍යතුමන්ගේ
අනුමැතිය 2026/10/21 දිනා ලබා දී ඇති බව
සහතික කරමි.

~~ආණ්ඩුකාර ලේකම්/සභාකාර ලේකම්~~

පී.බී. අබේකෝන්
ලේකම්
රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශය